*සැ. යු.* - (i) 2014.01.10 වැනි දින පළවූ අංක 1845 දරන *ගැසට් පත්‍රයේ* I:III කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2013 වර්ෂය සඳහා වූ ගාල්ල සහ බලපිටිය අධිකරණ කලාපයන්ට අයත් ජූරි සභිකයින්ගේ නාමලේඛනයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,846 - 2014 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2014.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 56 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 60 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 61 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 පෙබරවාරි මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


55– B 080802—300 (2014/01)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 87

DRF/RECT/770(25).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

**නිළ ස්ථිර කිරීම්**

පහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2009 සැප්තැම්බර් මස 21 වැනි දින සිට මේජර් ජෙනරල් වරුන් වශයෙන් නිල ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

(අ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) අකුරටියගේ ලලිත් රාජ් විජේතුංග, යූඑස්පී ;
(ආ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) අබ්දුල් සාමාඩ් මොහමඩ් ෂහීර්,ආර්එස්පී ;
(ඇ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) ශ්‍රීනාත් මහේන්ද්‍ර ද ආබ්‍රේව් රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ එල්ඩීඑම්සී ;
(ඈ) බ්‍රිගේඩියර් (තාවකාලික මේජර් ජෙනරල්) දුක්ගන්නා රාලලාගේ අරුණ බණ්ඩාර ජයතිලක, ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එල්ඩීඑම්සී ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

01-393

---

2014 අංක 88

DIRF/RECT/271/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2013.06.29 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

සී/58515 කෙනි - කාලිංග දුමින්ද ශානුක සිල්වා - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
සී/58527 කෙනි - අරම්පත් පිහනගේ ධනුෂ්ක චරිත කුමාර අරම්පත් - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/58261 කෙනි - රණසිංහ ආරච්චිල්ලාගේ නුවන් චින්තක ගුණවර්ධන - ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය ;
සී/58530 කෙනි - ඉබුල්ගෙදර ලේකමලාගේ විරාන් භාෂණ ලේකම්ගේ - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ;
සී/58285 කෙනි - නම්බුකාර වෙල්ලාලගේ තිවංක දිනිඳු තිලකරත්න . විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/58508 කෙනි - විජේකෝන් මුදියන්සේලාගේ රෙස්ලි දර්ශන විජේකෝන් බණ්ඩාර - ගජබා රෙජිමේන්තුව ;
සී/58511 කෙනි - වේරගම හේවගේ ශ්‍රියන්ත වේරගම - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව ;
සී/58510 කෙනි - අධිකාරි ජයසුන්දර මුදියන්සේලාගේ ජනක ප්‍රියශාන්ත අධිකාරි - ගැමුණු හේවා බළකාය ;
සී/58512 කෙනි - හේරත් මුදියන්සේලාගේ වත්තේ ගෙදර තුසිත් දොරකුඹුර - යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව ;
සී/58514 කෙනි - නානායක්කාරවසම් එගොඩගේ රජිත සුදන්ත ඩයස් - ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව ;
සී/58535 කෙනි - තිබ්බොටුවාවේ පතිරණගේ සුනෙත් ප්‍රියංකර පෙරේරා - ගජබා රෙජිමේන්තුව ;
සී/58513 කෙනි - මැටිවල කුඹුරේ ගෙදර උදිත මහේෂ් ගුණරත්න - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/58065 කෙනි - බාලසූරිය මුදියන්සේලාගේ තිලෝක කෞශල් කුමාර බාලසූරිය - ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය ;
සී/58516 කෙනි - හෙන්නායක මුදියන්සේලාගේ තාරක නෙරන්ජන් දයානන්ද - ශ්‍රී ලංකා සංඥා බළකාය ;
සී/58256 කෙනි - සික්කු ආරච්චිගේ තිසර මදුසංඛ ආරච්චිගේ - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය ;
සී/58501 කෙනි - නවරත්න මුදියන්සේලාගේ දිලාන් රාජිත නවරත්න - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය ;
සී/58263 කෙනි - තරිඳු ධනුෂ්ක කළුදේව - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය ;
සී/58259 කෙනි - වර්ණකුලසූරිය සමිත් මෙතුෂ්ක ප්‍රනාන්දු - ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය ;
සී/58258 කෙනි - ඇස්සැද්දුමේ ආරච්චිලාගේ ශාලින්ද බණ්ඩාර කරුණාරත්න - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය ;
සී/58507 කෙනි - අහංගම විතානගේ චමින්ද තාරක විතානගේ - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/58505 කෙනි - වරද්දන මුදියන්සේලාගේ කෝලිත අයස්කාන්ත වරද්දන - ගැමුණු හේවා බළකාය ;
සී/58498 කෙනි - චරිත් ප්‍රියන්ත දිසානායක - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව ;
සී/58502 කෙනි - සිදත් සම්පත් සමරනායක - විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/58536 කෙනි - මිනුවන්පිටියගේ චානක අභය පීරිස් - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/58293 කෙනි - ලොකුබඩු වීරසූරිය පටබැඳිගේ ධම්මික වීරසූරිය - ගැමුණු හේවා බළකාය ;
සී/58342 කෙනි - මොහම්මදු නිෆාස් - ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය ;
සී/58526 කෙනි - අමිල ඉඳුනිල් ජයවර්ධන - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/58227 කෙනි - රාජකරුණා මහා දිසානායක පංඩිත වාසල අබේකෝන් මුදියන්සේ රාළහාමිලාගේ තරිඳු බංඩාර යටවර - ගජබා රෙජිමේන්තුව ;
සී/58537 කෙනි - කොච්චිගොඩ කංකානම්ගේ නිසල් නිවන්ත - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/58539 කෙනි - ඌරාපොල මුදලිගේ උදිත් කල්පන ජයවර්ධන - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය ;

සී/58506 කෙනි - රාමනායක මුදියන්සේලාගේ චතුරංග හර්ෂ ශ්‍රී රාමනායක - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව ;
සී/58534 කෙනි - රාජකරුණා ගෙදර නුවන් සම්පත් අබේරත්න - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය ;
සී/58089 කෙනි - තරිඳු ශංඛ කුමාර වික්‍රමසිංහ - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/58528 කෙනි - සුභාසිරි ප්‍රනීත් කුමාරගේ සුරාජ් දිලුම් කුමාර - ගජබා රෙජිමේන්තුව ;
සී/58531 කෙනි - සංජීව රුක්ෂාන් හිඳුරන්ගල - ශ්‍රී ලංකා පාබල හමුදාව ;
සී/58525 කෙනි - මුනහින් හේවාගේ රුමිල ශ්‍යාමෙන් ප්‍රේමතිලක - ගැමුණු හේවා බළකාය ;
සී/58529 කෙනි - මිගෙල් හේවාගේ නලින් විරංග ඉන්ද්‍රවංශ - විජයබාහු පාබල රෙජිමේන්තුව ;
සී/58533 කෙනි - බෝපේ ආරච්චිලාගේ ජනිත මධුරංග මුනිප්‍රේම - ගැමුණු හේවා බළකාය ;
සී/58253 කෙනි - රාවත්ත විදාන කංකානම්ගේ චානක දේශප්‍රිය - ගජබා රෙජිමේන්තුව ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

01-392

---

2014 අංක 89

MOD/DEF/2/01/ENL/02/LCDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

පහත නම් සඳහන් කාන්තා කෙඩෙට් නිලධාරීන් 2013.06.29 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ :

සී/58900 කාන්තා කෙඩෙට් නිලධාරී - වඩුතොම්බි ආරච්චිගේ දෝන කවිෂා කල්පනි - ශ්‍රීලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය ;
සී/58895 කාන්තා කෙඩෙට් නිලධාරී - නයෝමි ශකිලා හර්ෂණි තඹවිට - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

01-391

---

2014 අංක 90

MOD/DEF/03/02/RET/49.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2012 දෙසැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බළකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරුකිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමදෝරු මංගමුනි සුධර්මන් සිල්වා, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0248

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

01-480/1

---

2014 අංක 91

MOD/DEF/03/02/RET/49.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 දෙසැම්බර් මස 03 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බළකායෙන් විශ්‍රාම ගන්වා ඇත :

කොමදෝරු මංගමුනි සුධර්මන් සිල්වා, යූඑස්පී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0248

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

01-480/2

2014 අංක 92

MOD/DEF/03/02/RET/42.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මරුකිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 ඔක්තෝබර් මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බළකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කපිතාන් (මාලිමා) නිකගොඩ ආරච්චිලාගේ අජිත් ප්‍රියංකර නිකගොඩ, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0370

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

01-482/1

---

2014 අංක 93

MOD/DEF/03/02/RET/42.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 ඔක්තෝබර් මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බළකායෙන් විශ්‍රාම ගන්වා ඇත :

කපිතාන් (මාලිමා) නිකගොඩ ආරච්චිලාගේ අජිත් ප්‍රියංකර නිකගොඩ, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0370

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජූලි මස 07 වැනි දින,
කොළඹ දී ය.

01-482/2

---

2014 අංක 94

MOD/DEF/03/02/RET/44.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 අගෝස්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගන්වා ඇත :

කොමාණ්ඩර් (නාසෙ) කිරිදෙන මයුරපක්ෂ වාසල හේරත් මුදියන්සේලාගේ ප්‍රියන්ත කුමාර සෙනවිරත්න, ශ්‍රීලංනාහ - එන්ආර්පී 0747

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

01-479

---

2014 අංක 95

MOD/DEF/03/02/RET/47.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

කොමාණ්ඩර් (සැ) සායක්කාර රත්නහලුගේ අනුර සායක්කාර, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0763

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

01-481/1

2014 අංක 96

MOD/DEF/03/02/RET/47.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 සැප්තැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිතය බලකායෙන් විශ්‍රාමගන්වා ඇත :

කොමාණ්ඩර් (සැ) සායක්කාර රත්නහලුගේ අනුර සායක්කාර, ශ්‍රීලංනාහ - එන්ආර්එස් 0763

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

01-481/2

2014 අංක 97

MOD/DEF/03/02/RET/48.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරියා 2012 දෙසැම්බර් මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාමගන්වා ඇත :

කොමාණ්ඩර් (නාසෙ) ජයවීර ආරච්චිගේ ජයන්ත කුමාර පෙරේරා, ශ්‍රීලංනාහ - එන්ආර්පී 0741

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

01-478

2014 අංක 98

MOD/DEF/03/02/VNF/PRO.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2012 ජනවාරි මස 29 වැනි දින සිට ලුතිතන් කොමාණ්ඩර් (නැබ) වශයෙන් :*

ඒකනායක ආරච්චිලාගේ රොහාන් සමන්ත ඒකනායක එන්වීඑච් 5307 - ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

01-477

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරිය ඉවත් කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරිය 2010 අප්‍රේල් මස 23 වැනි දින සිට ඉවත් කිරීම ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත :

බලසෙණ නායක ෂම්මි දිල්රුක් බරුපොල (02050) විද්‍යුත් ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

01-483/1

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පහත නම සඳහන් නිලධාරියාගේ අධිකාරියෙන් ඉවත් කිරීම 2009 අගෝස්තු මස 01 දින සිට අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කොට ඇත :

ෆලයිට් ලෙප්ටිනන් පරණමාන පතිරන්නැහේලාගේ අමිල මේනක දුනුමඩලාව (02283) පරිපාලන/රෙජි

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 19 වැනි දින,
කොළඹ දී ය.

01-483/2

2014 අංක 99

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2013 ඔක්තෝබර් මස 01 වැනි දින සිට කර්නල් වශයෙන් :*

නි/3133 ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) ඩබ්එම්එම්ජ්බී වෙළගෙදර ;
නි/3157 ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) එස්එම්ජී සමරකෝන් ;
නි/3130 ලුතිතන් කර්නල් (තාවකාලික කර්නල්) ඩී ද සිල්වා ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

කොළඹ දී ය.

01-484

# රජයේ නිවේදන

**බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත**

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමය :

දි. මු. ජයරත්න,
බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

**නියමය**

1931 අංක 19 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධිත) ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ වූ ද 1931 දෙසැම්බර් මස 04 වැනි දින අංක 7896 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලදුව කලින් කල සංශෝධනය කරන ලද්දා වූ ද, ප්‍රකාශනයෙහි උපලේඛනයට මෙහි උපලේඛනයෙහි විස්තර කොට ඇති සිද්ධස්ථානය ඇතුළත් කිරීමෙන්, ඒ ප්‍රකාශය තවදුරටත් සංශෝනය කරනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, උඩුකහා දකුණු කෝරළේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හුම්බුළුව පිහිටි හුම්බුළුව රජමහා විහාරය.

01-452

**වන්දනා ආඥාපනත**

**ගොඩපිටිය මුස්ලිම් උත්සවය - 2014**

මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගොඩපිටිය පෝරුවේ (අකුරැස්ස - ගොඩපිටිය) මුහියද්දීන් මුස්ලිම් දේවස්ථානයේ වාර්ෂික ආගමික උත්සවය 2014 පෙබරවාරි මස 05 වැනි දින සිට ආරම්භ වී 2014 පෙබරවාරි මස 16 වැනි දින අවසන් කරන බව (175 අධිකාරය) වන්දනා ආඥාපනත යටතේ සකස් කර, 1954 ජනවාරි මස 08 වැනි දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රෙගුලාසිවල 3 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

1954 ජනවාරි මස 08 වැනි දින අංක 10630 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රෙගුලාසි ඉහත පැවැත්වෙන කාලය තුළ දී එකී රෙගුලාසි වල සඳහන් එහිම ඡේදයෙන් විස්තර වන "කඳවුරු තුළ " ක්‍රියාත්මක වේ.

ටී. ජී. සරත් කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
අතුරුලිය.

2014 ජනවාරි මස 02 වැනි දින,
අතුරුලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-525

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - මාරවිල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.09.24 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. එස්. රන්සිරිනි ජොශප් මහත්මිය විසින් 2011.01.07 වැනි දින රු. 10,000,000 සඳහා සහතික කරන ලද අංක 07 දරන උකස්කරය ද 2011.01.07 රු. 3,000,000 ක් සඳහා සහතික කරන ලද අංක 09 දරන උකස්කරය ද යන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්, මිහිදුකුලසූරිය සෙබස්තියන් ටෙලිම්බට් මහීල් මත්තෙස් යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් එකසිය තුන් ලක්ෂ හතලිස් පන් දහස් නවසිය තිස් පහ (රු. 10,345,935) ක මුදලක් සහ රුපියල් තිස්පන් ලක්ෂ හතලිස් තුන් දහස් අටසිය අසූ හතයි ශත දොළහ (රු. 3,543,887.12) ක මුදලක් අයවීමට ඇති බැවින් ද, 2013.07.01 වැනි දින සිට වර්ෂයකට 15.5% බැගින් රුපියල් එකසිය තුන් ලක්ෂ හතලිස් පන් දහස් නවසිය තිස් පහ (රු. 10,345,935) ක මුදල සඳහා පොලිය ද, 2013.07.01 දින සිට වර්ෂයකට 17% බැගින් රුපියල් තිස්පන් ලක්ෂ හතලිස් තුන් දහස් අටසිය අසූ හතයි ශත දොළහ (රු. 3,543,887.12) ක මුදල සඳහා පොලිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් (29 එල්) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් එකසිය තුන් ලක්ෂ හතලිස් පන් දහස් නවසිය තිස් පහ (රු. 10,345,935) ක මුදල සහ රුපියල් තිස්පන් ලක්ෂ හතලිස් තුන් දහස් අටසිය අසූ හතයි ශත දොළහ (රු. 3,543,887.12) ක මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් එකී අංක 07 දරන උකස්කරය සහ අංක 09 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පණතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇත බලතල අනුව මජහන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තිරණය කරයි.

### උකස් කර ඇති දේපළ විස්තරය

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් උතුරු පිටිගල් කෝරළේ මුන්නේස්වරම් සහ යගම් පත්තුවේ කරුක්කුව සහ ගලහිටියාව නමැති ගම්වල පිහිටි ගලහිටියාව එස්ටේට් හෙවත් කැරුක්කුව එස්ටේට් නමැති ඉඩමට ඒ. ඒ. විමලසේන බලයලත් මානක තැන විසින් 2000.10.26 වැනි දින මැන සාදන ලද අංක 2187 ඩී දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 05 දරන කොටසට මායිම්, උතුරු නැගෙනහිරට : රේල්වේ සහ රේල්වේ රිසර්වේෂන් ද, දකුණු නැගෙනහිරට : ඉහත පිඹුර අනුව ලොට් අංක 04 දරන කොටස, දකුණු බස්නාහිරට : ලොට් අංක 06 සහ අඩි 30ක් පළල පාර ලෙස ලියාපදිංචි වී තිබුණ ද අදාළ හිමිකම් ඔප්පුව ප්‍රකාරව ඉහත පිඹුර අනුව ලොට් අංක 06 දරන අඩි 20ක් පළල පාර ද, උතුරු බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද,

යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර දහතුන (අක්. 13 රූඩ් 0 පර්. 0) ක් විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 44/287 සී, 192/240 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

01-518

---

## මහජන බැංකුව - වත්තල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජී. එන්. ප්‍රගති විසින් සහතික කරන ලද 2007.07.11 දිනැති අංක 68 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, කලුවා දේවගේ අශෝකා ප්‍රභාවතී ප්‍රනාන්දු සහ මකරන්ද අභිෂේක වැලිවිටිගොඩ, යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දහසය ලක්ෂය (රු. 1,600,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2009.10.05 වැනි දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් දහසය ලක්ෂය (රු. 1,600,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දහසය ලක්ෂය (රු. 1,600,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඩලස් කෙලාවිස් (පුද්ගලික) සමාගම විසින් එකී අංක 68 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ දකුණු අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ පැලියගොඩ ගමේ පැලියගොඩ නගර සභා සීමාව තුළ පිහිටි වරිපනම් අංක 351, මීගමු පාර පැලියගොඩ පිහිටි හල්ගහවත්ත, ටූකරගේවත්ත (වඩාත් නිවැරදි ලෙස සකුරාගේවත්ත) පයියරගෙවත්ත සහ අත්තික්කාගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. අලහකෝන් මහතා විසින් 1995.08.26 වැනි දින සකස් කර ඇති අංක 800 දරන පිඹුරේ ලොට් අංක බී 01 දරන ඉඩම් කොටසට මායිම්, උතුරු නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් මයා විසින් පිළියෙල කළ පිඹුරු අංක 410 හි සඳහන් ලොට් ඒ ද වරිපනම් අංක 357

මීගමු පාර දරන පරිශ්‍රය ද, දකුණු-නැගෙනහිරට : මීගමු පාර ද, දකුණු බස්නාහිරට : පී. මැගිනෝනාට අයත් ඉඩම ද, වරිපනම් අංක 347 මීගමු පාර දරන පරිශ්‍රය, උතුරු බස්නාහිරට : මෙම ඉඩමේ ම ඉතිරි කොටස ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම තුනයි පහ (අ. 0, රූ. 0, පර්. 10.35) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 944/228 හි ලියාපදිංචි වී ඇත. මෙම ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටස් හි මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර, මුදුන්ගොඩ.

01-519

---

### මහජන බැංකුව - මහවැව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.06.28 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් 2008.08.21 වැනි දින රු. 3,000,000ක මුදල සඳහා සහතික කරන ලද අංක 6770 දරන උකස්කරය ද, 2009.11.27 වැනි දින රු. 2,500,000 ක් (රු. 1,500,000+1,000,000) සඳහා සහතික කරන ලද අංක 7935 දරන උකස්කරය ද, 2011.06.02 වැනි දින රු. 1.300,000ක් සඳහා සහතික කරන ලද අංක 10262 දරන උකස්කරය ද යන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්, ජයසිංහ ආරච්චිලාගේ දොන් හේමචන්ද්‍ර සෝමසිරි හෙවත් ජයසිංහ ආරච්චිගේ දොන් හේමචන්ද්‍ර සෝමසිරි සහ ජයසිංහ ආරච්චිගේ දොන් තිලක් විජයකුමාර යන අයවලුන් විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් ලක්ෂ පහක (රු. 5,00,000) මුදලක් රුපියල් හය ලක්ෂ විසිපන් දාහක (රු. 6,25,000) ක මුදලක් රුපියල් නව ලක්ෂ අනූ නව දහස් අටසිය අසූ තුනයි ශත හැත්තෑ දෙකක (රු. 9,99,883.72) මුදලක් සහ රුපියල් නව ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය තිස් තුනයි හත හතලිස් හතර (රු. 9,53,333.44) ක මුදලක් අයවීමට ඇති බැවින් ද, 2012.10.21 දින සිට වර්ෂයකට 26% බැගින් රුපියල් ලක්ෂ පහක (රු. 500,000) මුදල සඳහා පොලිය ද, 2012.11.01 දින සිට වර්ෂයකට 17% බැගින් රුපියල් හය ලක්ෂ විස්පන් දාහක (රු. 6,25,000) මුදල සඳහා පොලිය ද, 2013.01.01 දින සිට 17% බැගින් රුපියල් නව ලක්ෂ අනූ නව දහස් අටසිය අසූ තුනයි ශත හැත්තෑ දෙකක (රු. 999,883.72) මුදල සඳහා පොලිය ද, 2012.11.02 දින සිට වර්ෂයකට 15% බැගින් රුපියල් නව ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත හතලිස් හතරක (රු. 9,53,333.44) මුදල සඳහා පොලිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය හා අදාල මහජන බැංකු පනතේ 29 එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් ලක්ෂ පහක (රු. 500,000) මුදල, රුපියල් හය ලක්ෂ විසිපන් දාහක (රු. 625,000) මුදල රුපියල් නව ලක්ෂ අනූ නව දහස් අටසිය අසූ තුනයි ශත හැත්තෑ දෙකක (රු. 999,883.72) මුදල සහ රුපියල් නව ලක්ෂ පනස් තුන් දහස් තුන්සිය තිස් තුනයි ශත හතලිස් හතරක (රු. 953,333.44) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 6770 දරන උකස්කරය, අංක 7 දරන උකස්කරය සහ අංක 10262 දරන උකස්කරය ද යන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් දකුණු පිටිගල් කෝරළේ යටකලන් පත්තුවේ පහල මහවැව නමැති ගමේ පිහිටි කජුගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක වයි. එම්. රංජිත් යාපා මහතා විසින් සාදන ලද 1996.09.14 දිනැති අංක 5091 දරන පිඹුර ප්‍රකාර ලොට් 01 දරන කොටසට මායිම්, උතුරට : ඩබ්. ලාවුස් ප්‍රනාන්දු යන අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඒ. එම්. කනකරත්නගේ ඉඩම ලෙස ලියාපදිංචි වී තිබුණ ද අදාළ පිඹුර ප්‍රකාරව ඒ. එම්. කනකරත්නගේ ඉඩම ද, දකුණට : ඉහත පිඹුර අනුව ලොට් අංක 02 සහ 03 දරන පාර ද, බස්නාහිරට : කේ. ස්ටැන්ලි සේනාරත්න යන අයට අයිති ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 22.5) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි පහයි හයයි නවය (හෙක්. 0.0569)ක් විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K99/230 හි ලියාපදිංචි වී ඇත.

2. ඉහත කී පහල මහවැව නමැති ගමේ පිහිටි කජුගහවත්ත නමැති ඉඩමට වයි. එම්. රංජිත් යාපා බලයලත් මානක තැන විසින් 1996.09.14 වැනි දින මැන සාදන ලද අංක 5091 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 02 දරන කොටසට මායිම්, උතුරට : ඉහත පිඹුරේ ලොට් අංක 01 දරන කොටස ද, නැගෙනහිරට : ඉහත පිඹුරේ ලොට් අංක 03 දරන පාර ද, දකුණට : තොඩුවාව සිට මහවැව දක්වා දිවෙන ප්‍රධාන පාර ද, බස්නාහිරට : කේ. ස්ටැන්ලි සේනාරත්න යන අයට අයිති ඉඩම ද. යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම පහක් (අක්. 0, රූ. 0, පර්. 22.5) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි හයයි නවයක් (හෙක්. 0.0569) විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ආදී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 99/231 හි ලියාපදිංචි වී ඇත.

3. ඉහත කී පහල මහවැව නමැති ගමේ පිහිටි කජුගහවත්ත නමැති ඉඩමට වයි. එම්. රංජිත් යාපා බලයලත් මානක තැන විසින් 1996. 09.14 වැනි දින මැන සාදන ලද අංක 5091 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 03 දරන කොටසට මායිම්, උතුරට : ඉහත පිඹුරේ ලොට් අංක 01 දරන කොටස ද, නැගෙනහිරට : ඒ. එම්. කරුණාරත්නගේ ඉඩම ලෙස ලියාපදිංචි වී තිබුණ ද අදාළ පිඹුර ප්‍රකාරව ඒ. එම්. කනකරත්නගේ ඉඩම ද, දකුණට : තොඩුවාව සිට මහවැව දක්වා දිවෙන ප්‍රධාන පාර ද, බස්නාහිරට : ඉහත පිඹුර අනුව ලොට් අංක 02 දරන කොටස ද, යන මෙකී මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම දෙකක් (අක්. 0, රූ. 0, පර්. 4.2) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි එකයි බිංදුවයි හයක් (හෙක්. 0.0106)

විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් භාවිතා කිරීමේ මාර්ග අයිතිය මේ සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 99/232 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

2013 ජූනි මස 03 වැනි දින,
මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

01-520

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 05/512/02/2265/පීඕ1/629.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.09.30 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. වී, පී. කුරේ විසින් සහතික කරන ලද 2012.08.06 දින හා අංක 2165 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, යක්කල, වැරැල්ලවත්ත, අංක 1/132හි පදිංචි සේනානායක අප්පුහාමිලාගේ ප්‍රියන්ත සේනානායක යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2013.09.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙසිය හතලිස් හත් ලක්ෂ එක්දහස් පන්සිය තිස් නවයයි ශත හැත්තෑවක (රු. 2,47,01,539.70 මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2165 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දොළොස් දහස් අටසිය පනස් අටයි ශත තිස්තුන (රු. 12,858.33) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න).

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12. බෙල්මන්ට් වීදිය, අංක 53හි බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් මාරපොල ප්‍රාදේශීය සභා සීමාවේ අංක 129 මාරපොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මාරපොළ පිහිටි කිංග්ස්වේල් පාක් එස්ටේට් නම් වූ ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් මහතා විසින් 2011 අගෝස්තු මස 23 වැනි දින සැකසුනු 1351 දරන මිනුම් පිඹුරට අනුව කැබලි අංක සී ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 07, රූ. 03, පර්. 16ක් වූ බිම් කොටස හා ඊට අයත් ගොඩනැගිලි ආදිය ද වේ.

මෙය ඉහත දැක්වෙන මිණුම් පිඹුරට අනුව ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඒ 490/31 හි ලියාපදිංචි කර ඇත.

ඩබ්. ජේ. කේ. ගීගනගේ (මෙය),
වැඩ බලන සාමාන්‍යාධිකාරී.

2013 දෙසැම්බර් මස 27 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

01-532

---

**ඩී එෆ් සී සී වර්ධන බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 නොවැම්බර් මස 29 වැනි දින දී මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට දඹුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් පී, ඩබ්ලිව්. එන්. කේ. හීන්කෙන්ද විසින් ලියා සහතික කරන ලද අංක 996 හා 2009 ජුනි මස 09 වැනි දින ද, අංක 1076 හා 2009 නොවැම්බර් 30 දින ද, අංක 1385 හා 2011 මාර්තු මස 30 වැනි දින ද, අංක 1462 හා 2011 ජූලි මස 01 දින ද, අංක 1463 හා 2011 ජූලි 01 දින ද, අංක 1464 හා 2011 ජූලි 01 දින ද, අංක 1470 හා 2011 ජූලි 18 දින ද, අංක 1471 හා 2011 ජූලි 18 දින ද දරන සියලු උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, දඹුල්ල, කුරුණෑගල හන්දිය අංක 443 දරන ස්ථානයේ කඹුරාවල ආරච්චිගේ සුසිල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2013 අගෝස්තු මස 31 වැනි දිනට ඉහත කී කඹුරාවල ආරච්චිගේ සුසිල් යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් පනස් එක්ලක්ෂ හතලිස් හත්දහස් දෙසිය තිස්අටකුත් ශත පහළොවක (රු. 51,47,238.15) මුදලක් සහ 2013 සැප්තැම්බර් මස 01 වැනි

දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටහය දහස් තුන්සිය තිස්දෙකකුත් ශත තුනක් (රු. 66,332.03) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද, රුපියල් තිස් හතර ලක්ෂ දොළොස් දහස් දෙසිය හතරකුත් ශත තිස් අටක් (රු. 34,12,204.38) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී, ආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද රුපියල් එකොළොස් ලක්ෂ අසූනව දහස් තුන්සිය විසිදෙකකුත් ශත නවයක් (රු. 11,89,322.09) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී, ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පනස් එක්ලක්ෂ හතලිස් හත් දහස් දෙසිය තිස්අටකුත් ශත පහළොවක (රු. 51,47,238.15) මුදලක් සහ 2013 සැප්තැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටහය දහස් තුන්සිය තිස්දෙකකුත් ශත තුනක් (රු. 66,332.03) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5ට තින්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොලිය ද, රුපියල් තිස් හතර ලක්ෂ දොලොස් දහස් දෙසිය හතරකුත් ශත තිස් අටක් (රු. 34,12,204.38) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යම මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය ද, රුපියල් එකොලොස් ලක්ෂ අසූනව දහස් තුන්සිය විසිදෙකකුත් ශත නවයක් (රු. 11,89,322.09) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන, බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතියක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තින්දු කරන වාර්ෂික අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ වාහන, ඉඩම් හා පරිශ්‍ර විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 996, 1076, 1385, 1462, 1463, 1464, 1470 සහ 1471 දරන උකස් බැඳුම්කර මගින් කඹුරාවල ආරච්චිගේ සුසිල් යන අය ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන වාහන, ඉඩම් හා පරිශ්‍ර සහ එහි පිහිටි වෙනෙත් සියලු දේ කොළඹ ෂොක්මන් සහ සමරවික්‍රම, බලයලත් වෙන්දේසිකරුවන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.".

### අංක 996, 1385 හා 1471 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපනහ පල්ලේසිය පත්තු කෝරළේ, දඹුල්ල පාදෙනිය ග්‍රාමයේ පිහිටි "අපුල්ලපුවැව වෙලපහල යාය" නමැති ඉඩමේ, බලයලත් මානක ඒ. එම්. අනුරරත්න මැන සකස් කළ අංක 189 හා 1998 සැප්තැම්බර් මස 21 වැනි දින දරන පිඹුරේ ලොට් 1-B ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : දැනට එස්. ආර්. සමරසිංහ හිමිකම් කියන එම ඉඩමේ කොටසක් ද, නැගෙනහිරට : ලොට් 1C (අඩි 10ක් පළල පාර) ද, දකුණට : හලුවපුල්ලවැව සිට දඹුල්ලට යන පාර ද, බස්නාහිරට : අයි. ජී. ජංගුවාගේ ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් දහසයක් (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

මෙයට ඉහත කී පිඹුරේ පාරක් සඳහා වෙන්කර තිබෙන මෙහි විස්තර කර තිබෙන බිම තුළින්, මතින් හෝ ඔස්සේ, උකස්කරුට ද ඔහුගේ අමුත්තන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයන්ට මින් ඉදිරියට ඔවුන්ගේ කැමැත්ත පරිදි සෑම කල්හිම හා සාදාකාලයට කවර හෝ කාර්යයක් සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ දී පයින් හෝ අන්‍යාකාරයකින් අශ්වයින්, ගවයින් හෝ වෙනත් සතුන් සහිතව හෝ නොමැතිව බර පැටවූ හෝ නොපැටවූ මෝටර් කාර්, මෝටර් ලොරි සහ සෑම වර්ගයකම වෙනත් වාහන මඟින් යාම ඒමේ හා ප්‍රත්‍යාගමනය කිරීමේ අයිතිවාසිකම ද, ඒ සමග සාමාන්‍යයෙන් ප්‍රයෝජනයට ගන්නා හෝ භුක්ති විඳින සියළු හා එක් එක් අයිතිවාසිකම්, වරප්‍රසාද හා අනුබන්ධන ද, තව ද එයට ඉහළින්, යටින් හෝ එය ඔස්සේ විදුලි රැහැන්, උඩින් කම්බි සහ ජලාපවහන, ගෑස් සහ ජලනල එලීමේ හා වෙනත් උවාරණ හා ක්‍රමෝපාය යෙදීමේ අයිතිය ද ඇතුළත් වේ.

### අංක 1470 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

1. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ. වගපණහ පල්ලේසිය පත්තුවේ, ඉබ්බන්කටුවේ පිහිටි නයිගලවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩමේ (ජී. එස්. ගලගෙදර බලයලත් මානක විසින් මැන සකස් කළ අංක 465 පිඹුරේ ලොට් 1C හා 2A කට්ටිවල කොටස් වූ) ඩබ්ලිව්. ඒ. එම්. ඩී. විජේසිංහ (ලියාපදිංචි බලයලත් මානක) විසින් සකස් කළ අංක 239/2010 හා 2009.12.24 දින දරන පිඹුරේ ලොට් අංක 37 ලෙස නිරූපිත බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : (බලයලත් මානක) ජී. එස්. ගලගෙදර විසින් මැන සකස් කළ අංක 465 දරන පිඹුරේ ලොට් අංක 36 සහ ලොට් අංක 2B ද, නැගෙනහිරට : (බලයලත් මානක) ජී. එස්. ගලගෙදර විසින් මැන සකස් කළ අංක 465 දරන පිඹුරේ ලොට් අංක 2B ද, දකුණට : ලොට් අංක 38 ද, බස්නාහිරට : ලොට් අංක 34 ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 239/2010 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

2. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, වගපණහ පල්ලේසිය පත්තුවේ, ඉබ්බන්කටුවේ පිහිටි නයිගලවත්ත යනුවෙන් හැඳින්වෙන ඉඩමේ (ජී. එස්. ගලගෙදර බලයලත් මානක විසින් මැන සකස් කළ අංක 465 පිඹුරේ ලොට් 1C සහ 2A කට්ටිවල කොටස් වූ) ඩබ්ලිව්. ඒ. එම්. ඩී. විජේසිංහ (ලියාපදිංචි බලයලත් මානක) විසින් සකස් කළ අංක 239/2010 හා 2009.12.24 දින දරන පිඹුරේ ලොට් අංක 38 ලෙස නිරූපිත බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ උතුරට : (බලයලත් මානක) ජී. එස්. ගලගෙදර විසින් මැන සකස් කළ අංක 465 දරන පිඹුරේ ලොට් අංක 37 සහ ලොට් අංක 2B ද, නැගෙනහිරට : (බලයලත් මානක) ජී. එස්. ගලගෙදර විසින් මැන සකස් කළ අංක 465 දරන පිඹුරේ ලොට් අංක 2B ද, දකුණට : ලොට් අංක 39 ද, බස්නාහිරට : ලොට් අංක 34 ද යන මායිම් ඇතුළත් ඉහත කී අංක 239/2010 දරන පිඹුර ප්‍රකාර පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

දඹුල්ල/නාඋල ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජී. මුණසිංහ ලියා සහතික කළ අංක 9474 හා 2010.10.18 දින දරන පිඹුර යටතේ හිමිකම හා සන්තකය දරනු ලැබේ.

**අංක 1076 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගපණහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල පාදෙනිය ග්‍රාමයේ පිහිටි, ජේ. ටී. ගලගෙදර මානකවරයා විසින් මැන සකස් කළ අංක 1871/A2 පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 14 ද, දකුණට : ලොට් අංක 6 ද, නැගෙනහිරට : වසන්ත වික්‍රමසිංහගේ ඉඩම ද, බස්නාහිරට : ලොට් අංක 13 (අඩි 18ක් පළල පාර) ද යන මායිම් ඇතුළත පර්චස් තිස් තුනකුත් දශම නවයි හයක් (අ. 0, රූ. 0, පර්. 33.96) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි වැවිලි හා වෙනත් සියලු දේ.

**අංක 1462 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වාහනයේ විස්තරය**

| *හඳුනාගැනීමේ අංකය (ලියාපදිංචි අංකය)* | *විස්තරය, වර්ගය මෝස්තරය, අශ්වබලය යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නවතා තබනා ස්ථානය* |
|---|---|---|---|---|
| 68-4700 | වර්ගය - ලංකා අශොක් ලේලන්ඩ්<br>මෝස්තරය - ටස්කර්<br>පංතිය - මෝටර් ලොරි | LALG-03476 | BXE 197358 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දඹුල්ල, කුරුණෑගල හංදිය අංක 443 හෝ එය නවතා තබනු ලැබිය හැකි වෙනත් ස්ථානයක් හෝ ස්ථාන |

**අංක 1463 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වාහනයේ විස්තරය**

| *හඳුනාගැනීමේ අංකය (ලියාපදිංචි අංකය)* | *විස්තරය, වර්ගය මෝස්තරය, අශ්වබලය යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නවතා තබනා ස්ථානය* |
|---|---|---|---|---|
| CP-JN- 4804 | වර්ගය - ලංකා අශොක් ලේලන්ඩ්<br>මෝස්තරය - ටස්කර් සුපර්<br>පංතිය - මෝටර් ලොරි | NWE-531975 | NWE-396728 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දඹුල්ල, කුරුණෑගල හංදිය අංක 443 හෝ එය නවතා තබනු ලැබිය හැකි වෙනත් ස්ථානයක් හෝ ස්ථාන |

**අංක 1464 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද වාහනයේ විස්තරය**

| *හඳුනාගැනීමේ අංකය (ලියාපදිංචි අංකය)* | *විස්තරය, වර්ගය මෝස්තරය, අශ්වබලය යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *නවතා තබනා ස්ථානය* |
|---|---|---|---|---|
| CP-LE- 9304 | වර්ගය - අයිවර්<br>මෝස්තරය - 20.16 HSD ට්‍රක්<br>පංතිය - මෝටර් ලොරි | 30KC5E 004721 | E683-CD5D007274 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දඹුල්ල, කුරුණෑගල හංදිය අංක 443 හෝ එය නවතා තබනු ලැබිය හැකි වෙනත් ස්ථානයක් හෝ ස්ථාන. |

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැංක් පීඑල්සී,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

01-456

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.